# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2017 අප්‍රේල් මස 07 වන දින
ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 මාර්තු මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[176 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 005163—475 (2017/04)

## *නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් ආනයන මත සේවා ගාස්තු කලින් අය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ නියමිත බැරකමට එරෙහිව සේවා ගාස්තුව හිලව් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය මේ පනතේ 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් ඇතුළත් කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල්වල සිල්ලර අලෙවිය මත සේවා ගාස්තු අය කිරීම වේ.

## ආර්ථික සේවා ගාස්තු
## (සංශෝධන)

එල්.ඩී.—ඕ. 72/2016.

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක  දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ පනතේ ඇතැම් විධිවිධාන ක්‍රියාත්මක වන දිනය අදාළ වගන්තිවල නිශ්චිතව දක්වා ඇත්නම් මිස, 2016 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(1) මේ පනතේ විධිවිධානවලට යටත්ව (මෙහි මින්මතු ''සේවා ගාස්තුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික සේවා ගාස්තුවක්, සෑම තැනැත්තකුගෙන් ම සහ සෑම හවුල් ව්‍යාපාරයකින් ම අවස්ථාවෝචිත පරිදි, I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණ අනුව —

(අ) (මෙහි මින්මතු "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා ම ඒ අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම ; සහ

(ආ) රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කරන ලද ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ පිරිවැය, රක්ෂණ, නැව් ගාස්තු මත—

(i) 2016 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ විශේෂ භාණ්ඩ බද්දට යටත් වන සෑම ආනයන භාණ්ඩ තොගයක් සම්බන්ධයෙන්;

(ii) 2016 නොවැම්බර් මස 24 වන දින හෝ ඉන්පසුව රත්‍රන් හෝ වෙනත් වටිනා ලෝහ තොග ආනයනය කිරීම සම්බන්ධයෙන්; හෝ

(iii) 2017 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව මෝටර් වාහන තොග ආනයනය කිරීම සම්බන්ධයෙන්,

සෑම තැනැත්තකුගෙන් ම හෝ හවුල් ව්‍යාපාරයකින් ම,

අයකර ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ සහ අවස්ථාවෝචිත පරිදි මේ පනතේ I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණවල පටහැනිව කුමක් සඳහන් වුව ද යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයනය කිරීම 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උපචිත වන පිරිවැටුම සම්බන්ධයෙන් අය කළ යුතු සේවා ගාස්තුවේ අනුප්‍රමාණය සියයට 0.25 ක් නොඉක්මවිය යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) "යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙන් අයකළ හැකි සේවා ගාස්තුව අයකරනු නොලැබිය යුතු ය:" යන වචන වෙනුවට ''යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් අදාළ කාර්තුවක් සඳහා සේවා ගාස්තුව ගෙවීමට යටත් වන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් හැර ඒ

තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙන් අයකළ හැකි සේවා ගාස්තුව අය කරනු නොලැබිය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඈ) ඡේදයේ —

(i) "2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු එහෙත් 2017 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) "මිලියන පනහක් නොඉක්මවන, අවස්ථාවල දී" යන වචන වෙනුවට "මිලියන පනහක් නොඉක්මවන, අවස්ථාවල දී;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) 2017 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන රුපියල් මිලියන දෙළහයි දශම පහක් නොඉක්මවන:"; සහ

(ඈ) අතුරු විධානයේ (ii) වන උපඡේදයේ, "2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ "2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වී 2016 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානයේ "ගෙවිය යුතු ආදයම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට

අඩු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද තවදුරටත්, 2016 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා අවස්ථාවෝචිත පරිදි (1) වන හෝ (2) වන උපවගන්තිවලට අනුකූලව අඩු කිරීමෙන් පසු, ආර්ථික සේවා ගාස්තුව වශයෙන් අය කරනු ලැබූ මුදලේ යම් ශේෂයක් ඇත්නම්, එය පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු දෙකක කාලයක් ඇතුළත වූ එක් එක් තක්සේරු වර්ෂයට විභජනය කළ හැකි අතර, එසේ විභජනය කරනු ලැබූ මුදල් ප්‍රමාණ එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරයේ හවුල්කරු විසින් එම එක් එක් තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තියේ (3ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3ඇ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සේවා ගාස්තු ගෙවීමට යටත් වන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවනු ලැබූ සේවා ගාස්තුවේ ප්‍රමාණය—

(අ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සේවා ගාස්තුව ගෙවනු ලබන යම් කාර්තුවක් සඳහා 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ උපචිත වන යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සේවා ගාස්තු ගෙවීමට ඇති බැඳීමට එරෙහිව බැර කරනු ලැබිය හැකි ය ; සහ

(ආ) (අ) ඡේදය යටතේ බැර කරන ලද සේවා ගාස්තුව සහ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවා ඇති එහෙත් (අ) ඡේදයේ සඳහන් පරිදි බැර කරනු නොලැබූ සේවා ගාස්තුව මේ වගන්තියේ (1), (2) හෝ (3) වන උපවගන්තිවලට අනුකූලව අඩු කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනය සංශෝධනය කිරීම.**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනයේ "2012 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලය සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2012 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන, එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ කාලසීමාව සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියට IV වන උපලේඛනය ඇතුළත් කිරීම.**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"IV වන උපලේඛනය

(2 වන වගන්තිය)

**2016 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා**

| යටත්වන පිරිවැටුමේ කොටස | | එම කොටසට අදාළ වන සේවා ගාස්තුවේ අනුප්‍රමාණය |
|---|---|---|
| 1. | පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක අදාළ පිරිවැටුම හැර වෙනත් අදාළ පිරිවැටුමක් | සියයට 0.5 |
| 2. | පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ නියැලී සිටින තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක අදාළ පිරිවැටුමෙන් 1/10 ක් | සියයට 0.5.". |

**වලංගුභාවය.**

**6.** 2016 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය පිටසන් කරනු ලබන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ආර්ථික සේවා ගාස්තු එකතු කර ගැනීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරි බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සහ එම බදු එකතු කිරීම වලංගු ලෙස සිදු කර ඇති හා සිදුව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර,

එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් උද්ගත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ:

එසේ වුව ද, එම කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ නියෝගයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.